# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ප්‍රමිත අංක 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ගිණුම් තැබීමේදී කල්බදු ගෙවන්නා හෙළිදරව් කළ යුතු තොරතුරු ගිණුම් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 30 ප්‍රකාරව , ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණයට බලපෑම් කළ හැකි සියළුම සම්බන්ධිත පාර්ශ්වයන්ගේ සම්බන්ධතාවයන් ඔවුන් මූල්‍ය ගණුදෙනුවකට සම්බන්ධ වුවත් නැතත් ගිණුම් වල හෙළිදරව් කළ යුතු වුවත් , සංස්ථාව විසින් එම හෙළිදරව් කිරීම කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සංස්ථාවේ අසම්භාව්‍ය වගකීම් වූ රු. 5,670,876 ක වටිනාකම ගිණුම් සටහන්හි දැක්විය යුතු වුවද ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි. මෙම වෙන් කිරීම් තුල ඇතුලත් නොවූ රු. 774,540 ක් වූ වියදමක් මෙම වෙන් කිරීම මගින් ගැලපීම නිසා එම ප්‍රමාණයෙන් පාඩුව අඩුවී තිබුණි.

(ආ) සංස්ථාව සතු බාහිර පාර්ශවයන්ට කුලියට දුන් ගොඩනැගිල්ලේ කුලිය ගිණුම් ගතකිරීමේදී 2010 ට අදාල රු. 680,000 ක් සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම ලෙස ඇතුලත් කර තිබුණු අතර 2011 වර්ෂයට අදාල රු. 1,520,000 ක කුලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රත්මා මණ්ඩලය ගිණුම් මගින් බදු ගත් සිනමා ශාලාවේ බදු කුලි ආදායම හා එහි බදු කුලී වියදම එකම ගිණුමක පෙන්වීම මගින් රු.1,010,808 ක්වූ ආදායම හා රු. 926,574 ක්වූ වියදම මූල්‍ය

ප්‍රකාශ වලින් හෙළිදරව් නොවුණි. එසේම උපචිත බදු කුළිය වන රු. 84,234 ක් වෙනුවෙන් ගැලපීම් සිදු නොකිරීම මගින් එම ප්‍රමාණයෙන් වර්ෂයේ පාඩුව අඩුවී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා ගිණුම අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු සටහන් කරනු ලබන ජංගම ගිණුමක් වූ අතර එහි සමාලෝචිත වර්ෂයේ අවසන් ශේෂය රු. 84,071,406 ක් වශයෙන් දක්වා තිබුණි. නමුත් ඊට සමාන්තරව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ පවත්වාගෙන යනු ලබන චිත්‍රපට බෙදාහැරීමේ මණ්ඩල ගිණුමට එම ශේෂය ගැලපූ පසු තවදුරටත් පැවති ශේෂය රු. 2,832,555 ක් විය. ඒ අනුව අදාල ජංගම ගිණුම් සැසදීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ වැටුපට සාපේක්ෂව සකස් කළ පාරිතෝෂික වෙන් කිරීමේ ප්‍රමාණයෙන් පෙර වර්ෂ සඳහා වූ ප්‍රමාණය ලෙස රු. 1, 227,777 ක් ඉදිරියට ගෙන ආ අලාභයට හර කර තිබුණෙන් ඒ ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ පාඩුව අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පෙර වර්ෂයන්හි මුල්‍ය ප්‍රකාශන වල සාවද්‍ය ලෙස ගලපන ලද රු. 2,873,773 ක ක්ෂය අධි වෙන් කිරීමක් මෙම වර්ෂයේ නිවැරැදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලයට ගලපනවා වෙනුවට පෙර වර්ෂයේ අලාභයට ගලපා තිබුණි.

(උ) ආනයනය කරන ලද චිත්‍රපටයක ප්‍රදර්ශන කාලය මාස 6 ඉක්මවූ පසු එහි තොග වටිනාකමක් නොමැති වුවද එසේ කාලය ඉක්මවූ චිත්‍රපටයකට අදාලව රු. 4,568,026ක මුදලක් තොගයට ඇතුලත් කර තිබුණි.

(ඌ) විදේශීය රසායනාගාර සේවා ලබා ගැනීම සඳහා කර ඇති තැන්පතු වර්ෂය අවසානයට ඇති විනිමය අනුපාතය අනුව පරිවර්තනය කොට ගිණුම් ගත නොකිරීම හේතුවෙන් රු. 217 ,880 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සිනමාශාලා ණයගැති පාලන ගිණුමේ ශේෂය ලෙජරයට අනුව රු. 187,371,876 ක් වූ අතර උපලේඛනයට අනුව රු. 192,852,819 ක් වුයෙන් රු. 5,480,943 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 1.2.4.1 ලැබිය යුතු ගිණුම්

**(අ) නිෂ්පාදන ණයගැතියන්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රු. මිලියන 91 පමණ වු නිෂ්පාදන ණයගැතියන තුළ වර්ෂ 5 ඉක්මවු ණයගැතියන් ප්‍රමාණය රු. මිලියන 50 ක් හෙවත් 54% ක් විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගත් බවට තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවිණි.

(ii) නිෂ්පාදන ණයගැති පාලන ගිණුම අනුව හර ශේෂය රු. 89,116,396 ක් වු අතර එම අගයට චිත්‍රපට කුලී ණය නම් උපලේඛනයේ රු.12,007,567 ක් වූ හර ශේෂය හා විවිධ ණයගැති උපලේඛනයේ රු.3,022,409 ක් වූ බැර ශේෂය එකතු කර තිබුණි. නිෂ්පාදකයන් වෙත ලබාදී ඇති ණය මුදල් සඳහා අයවිය යුතු පොලිය ණයගැතියන්ට එකතු කර එම පොලිය 100 % නොලැබේය යන පදනම මත 50 % ක් පමණක් ආදායමට ගෙන ඉතිරි 50 % පොලි වෙන් කිරීමේ ගිණුමක ඇතුලත් කර එම ගිණුමේ බැර ශේෂය වු රු.2,965,479 ක් නිෂ්පාදන ණය ගැතියන් ගෙන් අඩුකර ශුද්ධ ණයගැති වටිනාකම රු.101,180,893 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**(ආ) සිනමාහල් ණයගැතියන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2001 වර්ෂයේ සිනමා ශාලා වල චිත්‍රපට බෙදාහැරීම පෞද්ගලික මණ්ඩලවලට පැවරීමට පෙර එහෙත් දැනට වසා දමා ඇති සිනමා ශාලා 146 කින් අයවිය යුතු හිඟ මුදල් 2011 දෙසැම්බර් 31 දිනට රු. 7,913,163 ක් විය.

(ii) දැනට ක්‍රියාත්මක වන මණ්ඩල වලට අයත් සිනමාශාලා 177 කින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 133,069,516 ක් විය. එසේම සිනමාශාලා 19 කට සංස්ථාව විසින් ගෙවිය යුතු මුදල රු. 1,356,993 ක් විය. සමාලෝචිත වර්ෂයේදීද අයවිය යුතු මුදල් අයකර ගැනීමට හා ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) වෙනත් ණයගැතියන්**

කාර්ය මණ්ඩලයේ 3 දෙනෙකු වෙත සේවයෙන් ඉවත් වීමේදී වැඩිපුර ගෙවන ලද රු.134,001 ක වන්දි මුදල් 1997 වර්ෂයේ සිට නිරවුල් කර ගැනීමට හෝ එය ගණනය කල නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර පොත් වලින් කපා හැර තිබුණි.

**(ඈ) බොල් ණය වෙන් කිරීම**

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2011 දෙසැම්බර් 31 දිනට සිනමාහල් , නිෂ්පාදන , වෙනත් ණය හා සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතු රු. 262,982,226 ක් අයකර ගැනීමට තිබුණි. එම ණයගැතියන්ගෙන් සඳහා කර ඇති මළු බොල්ණය ප්‍රතිපාදනය රු.73,274,300 ක් විය. මේ අනුව සංස්ථාවේ ණයගැතියන් ගෙන් 27 % ක් වැනි ඉතා ඉහල ප්‍රතිශතයක් ණය ආපසු අයකර ගැනීමට නොහැකි පදනම අනුව කටයුතු කරන බව නිරීක්ෂණය විය.

(ඉ) නොපියවූ අත්තිකාරම් ගිණුමේ 2000 සිට 2010 දක්වා අයිතම 19 ක් පියවා නොතිබුණු අතර එහි වටිනාකම රු.359,041 ක් විය.

### 1.2.4.2 ගෙවිය යුතු ගිණුම්

**(අ) චිත්‍රපට කුලි ණය හිමියන්**

චිත්‍රපට කුලී ණයහිමි උපලේඛනයට අනුව රු. 87,233,042 ක් වන බැර ශේෂයන්ගෙන් රු.31,147,340 ක් එනම් 36% ක් වර්ෂ 5 කට වඩා පැරණි ශේෂයන් බව නිරීක්ෂණය විය.

**(ආ) වෙනත් ණයහිමියන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.1,828,746 ක් වූ විවිධ ණය හිමියන් තුළ වසර 5 ක් ඉක්මවූ රු.1,121,213 ක ණයහිමි ශේෂයක් ව අතර ඒවා කපාහැරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වෙනත් ණයහිමියන් තුල 2003 සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලසීමාවට අයත් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු. 2,063,923 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණද මුදල් ගෙවීමක් සිදු කර නොතිබුණි. එසේම අදාල තහවුරු ලියවිලි, ණය හිමියන්ගේ ශේෂ තහවුරු කිරීම් නොවීම නිසාත් වසර පහක් ඉක්මවූ ණයහිමියන් පොත් වලින් ඉවත් කිරීමට නොහැකිව තිබුණි.

**(ඇ) චිත්‍රපට කුලී ණයහිමියෝ**

චිත්‍රපට කුලී ණයහිමි පාලන ගිණුමේ රු. 73,376,914 ක බැර ශේෂයට චිත්‍රපට සැපයුම් කරුවන් සඳහා වෙන්කිරීමේ ගිණුමේ රු. 2,000,000 ක ශේෂය එකතු කර චිත්‍රපට කුලී ණයහිමි වටිනාකම ලෙස රු.75,376,914 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිභාර වෙන්කිරීම , නිෂ්පාදන ණය පොලී වෙන්කිරීම, හිමිකම් නොපෑ වේතන, සේවක ණය අත්තිකාරම්, චිත්‍රපට සැපයුම්කරුවන් සඳහා වෙන්කිරීම, නඩු කටයුතු, ගෙවිය යුතු පිරිවැටුම් බදු, වලට අදාලව එකතුව රු. 82,772,745 ක් සඳහා ඇස්තමේන්තු, ලිපිගොනු, උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ලැබිය යුතු ආදායම් බදු ගිණුමේ රු. 2,615,507 ක ආරම්භක ශේෂයක් පැවතියද එම ශේෂය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි බව තහවුරු කෙරෙන ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මේ හේතුවෙන් එකී ශේෂවල නිරවද්‍යතාවයන් විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

### 1.2.6 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1971 අංක 47 දරන චිත්‍රපට සංස්ථා පනතේ 5 (ජ) වගන්තිය | චිත්‍රපට නිෂ්පාදනයට ණය දීම සංස්ථාවට කළ හැකි වුවත්,චිත්‍රපටවල ප්‍රමිතීන් සහතික කිරීම සඳහා චිතපට නිෂ්පාදනය කිරීමට හා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍යවන උපකරණ මිලට ගැනීම යන අංශ වෙනුවෙන් අරමුදල් සැපයීම අංක 799/1 හා 1993 දෙසැම්බර් 27 දිනැති ගැසට් නිවේදනය මගින් ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල වෙත පවරාදී තිබුණි. එසේ තිබියදී චිත්‍රපට සංස්ථාව විසින් සිනමාහල් සඳහා ශබ්ද උපකරණ මිලදී ගැනීමට රු.14,916,770 ක් ද චිත්‍රපට ශාලා දෙකක් නවීකරණය වෙනුවෙන් රු. 4,355,008 ක්ද වැය කර තිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය (ආ) හා 2000 ජුනි 12 දින හා අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වටිනාකම රු. 56,307,377 ක් වු ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රි ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ජේදයේ 6.1.5 වගන්තිය | අදාළ පත්වීම/උසස්වීම අනුමත බඳවාගැනීම් පරිපාටියට අනුකුල වියයුතු බව දක්වා තිබුණද, එයට පටහැනිව කාර්මික සහකාර හා ලිපිකරු තනතුරු වලට සේවකයන් 5 දෙනෙකු බඳවා ගෙන තිබුණි. |
| (ඇ) | ශ්‍රි ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මු.රෙ. 177 (1) | එකතු කරගන්නා රජයේ මුදල් දිනපතා ප්‍රේෂණය කළයුතු බව සහ තම තමන්ට ලැබෙන මුළු මුදල දිනපතා ප්‍රේෂණය කර එම මුදලට කුවිතාන්සි ලබාගත යුතු වුවද චිත්‍රාගාරය විසින් එකතුකර ගන්නා රු. 318,182 ක් වූ ආදායම් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |

(ii) මු.රෙ.371 — අත්තිකාරමක් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතුය. එසේ වුවත් වසර 1-11 දක්වා කාල පරාසයකට අයත් රු.1,338,386 ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි.

(iii) මු.රෙ 756 — බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණයක් සිදුකළ යුතුය. එමෙන්ම සමීක්ෂණ වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතුය. නමුත් චිත්‍රාගාරයේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 9.2 (ඩී) වගන්තිය — සංවිධාන සටහන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.72,582,062 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ වූ බදු පූර්ව ශුද්ධ අලාභය රු.74,215,601 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා රු.75,000,000 බැගින් භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදානයන් ගණන් ගත් විට සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයෙ ලාභ පිළිවෙලින් රු. 2,417,938 ක් හා රු. 784,398 ක් විය.

(ආ) 2006 වසරේ රු.මිලියන 51 ක් අලාභ ලැබූ අතර එය 2011 වනවිට රු.මිලියන 73 දක්වා පිළිවෙලින් වැඩිවී තිබුණි.

(ඇ) 2007 වර්ෂය දක්වා සමුච්චිත අරමුදල සෘණ අගයක් ගෙන තිබී 2008 වසරේදී රු.115,153,399 ක අගයකට වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් එතැන් සිට සමුච්චිත අරමුදලෙහි වාසිදායක ශේෂයක් පෙන්නුම් කෙරේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

**(අ) චිත්‍රපට ණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) 2011 වර්ෂයේදී චිත්‍රපට 12 ක් සඳහා චිත්‍රපට සේවා ණය වශයෙන් රු. 3,020,629 ක්ද, චිත්‍රපට 05 කට පිටපත් මුද්‍රණ කටයුතු සඳහා රු. 6,255,756 ක ණය මුදලක්ද, චිත්‍රපට 05 කට නිෂ්පාදන කටයුතු සඳහා රු. 5,409,072 ක ණය මුදලක්ද වශයෙන් එකතුව රු. 14,685,457 ක් ලබා දී තිබූ අතර එම වර්ෂයේදී චිත්‍රපට දෙකකට ලබා දී තිබුණු රු. 5,532,664 ක ණය මුදල් පමණක් ආපසු අය වී තිබුණි. මුදල් අයකර ගත හැකි වන්නේ චිත්‍රපට නිෂ්පාදනය නිමවී ප්‍රදර්ශන කටයුතු සඳහා මුදාහැරීමෙන් අනතුරුව බව සභාපති දැනුම් දී ඇත.

(ii) 2009 වර්ෂයේදී රු. 7,845,494 ක චිත්‍රපට නිෂ්පාදන ණය ලබා ගත් චිත්‍රපට 07 ක් හා 2010 වර්ෂයේදී රු. 2,298,016 ක චිත්‍රපට නිෂ්පාදන ණය ලබා ගත් චිත්‍රපට 04 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තිරගත වී නොතිබුණි.

(iii) ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් නොකළ චිත්‍රපට 26 ක් වෙනුවෙන් ලබාදුන් ණය රු. 4,229,646 ක් අවුරුදු පහට වැඩි කාලයක් පුරා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(iv) ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් නොකළ චිත්‍රපට 24 ක් වෙනුවෙන් ලබාදුන් අවුරුදු පහට අඩු ණය ප්‍රමාණය රු. 24,121,780 ක් විය.

(v) ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 45 ක් වෙනුවෙන් ලබාදුන් ණය රු. 23,913,254 ක් අවුරුදු පහට වැඩි කාලයක් පුරා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ආ) සිනමාශාලා සඳහා ණය ලබාදීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) 2003 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව රු. 1,100,000 ක මුදලක් සිනමාශාලාවක් වෙත ලබා දී තිබුණු අතර 2011 වර්ෂයේදී එම මුදල් ආපසු ගෙවීම ආරම්භ කර රු. 131,957 ක් ආපසු අය වී තිබුණු අතර ගිවිසුම් අත්සන් කිරීමක් සිදුවී නොතිබුණි.

(ii) 2011 වර්ෂයට පෙර සිනමාශාලා 06 ක් සඳහා රු. 4,748,294 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට එම සිනමා ශාලා වලින් අයවිය යුතු මුදල රු. 3,334,840 ක් විය. 2011 වර්ෂය තුලදී සිනමාශාලා 05 කින් රු. 716,668 ක මුදලක් ලැබී තිබුණු අතර එක් සිනමා ශාලාවකින් කිසිදු මුදලක් ලැබී නොතිබුණි.

**(ඇ) චිත්‍රපට ආනයනය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) සංයුක්ත සැලැස්මේ 3.4.2 අනුව චිත්‍රපට ආනයනයේදී ජත්‍යාන්තර වශයෙන් සම්මානයට පාත්‍ර වූ සම්භාව්‍ය චිත්‍රපටද ආනයනය කිරීමට කටයුතු කළ යුතුව තිබූ නමුත් ආනයනය කරන ලද චිත්‍රපට අධ්‍යාපනික / උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට වශයෙන් වර්ගකර හඳුනාගැනීමක් කර නොතිබුණි. තවද, ආනයනය කළ දමිල චිත්‍රපට 71 න් 31 ක්ම වැඩිහිටියන්ට පමණයි හා වැඩිහිටියන්ට වඩාත් සුදුසුයි ලෙස රූගුම් පාලක මණ්ඩලය විසින් වර්ග කරනු ලැබූ චිත්‍රපට විය.

(ii) සංයුක්ත සැලැස්මේ 3.4.3 අනුව ජාතික චිත්‍රපට සංස්ථාවද පෞද්ගලික අංශය හා තරගකාරීව චිත්‍රපට ආනයනය සඳහා සක්‍රීයව මැදිහත් වීම සිදුකළ යුතුය. 2011 වාර්ෂික ක්‍රියාකාර සැලැස්මෙහි ඒ සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, පෞද්ගලික අංශය විසින් 2011 වර්ෂය සඳහා චිත්‍රපට 125 ක් ආනයනය කර තිබුණු අතර සංස්ථාව විසින් එක් චිත්‍රපටයක් හෝ අනයනය කර නොතිබුණි.

(iii) චිත්‍රපට ආනයනය කිරීම සම්බන්ධයෙන් වන 2011 වසරේ කොන්දේසි මාලාවට අනුව අයකරන ලද සමහර ගාස්තු 2006 වසරේ කොන්දේසි මාලාවට වඩා අඩු වූ අතර වැඩිකර තිබූ ගාස්තු ඉතා සුළු මුදලකින් පමණක් වෙනස් වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංස්ථාවේ පරීක්ෂණ අංශය විසින් අනාවරණය කරගත් අක්‍රමිතා සඳහා 2011 වර්ෂය තුළදී රු. 384,265 ක් වටිනා හරපත් 78 ක් නිකුත් කර තිබුණද හරපත් 54 කින් රු. 211,585 ක් පමණක් ලැබී තිබුණි.

(ආ) 2003 වර්ෂයේදී බදු පදනම මත සංස්ථාව විසින් ලබාගත් සිනමා ශාලාවක් 2008 වර්ෂයේදී නීත්‍යානුකූල නොවන පරිදි හා බදු ගිවිසුමේ 3(ආ) විධිවිධානයන්ට පටහැනිව සිනමාශාලා පරිපාලනය බාහිර පාර්ශ්වයක් වෙත ලබා දී තිබුණද 2011 වසරට අදාළ පරිපාලන ගාස්තු සහ එහි මත්පැන් හලේ කුලී ආදායමද ගිණුම්ගත කර අයකර ගෙන නොතිබුණි.

(ඇ) බදු ගත් සිනමාශාලාවක බදු ගිවිසුම ආරම්භයේ සිට 2007 මාර්තු දක්වා එහි අධීක්ෂණ කටයුතු සඳහා යොදවා ගෙන සිටි සේවකයකු විසින් රු. 471,257 ක මුදලක් ආදායම වශයෙන් එවිය යුතු වුවද එම මුදල 2012 අගෝස්තු දක්වා සංස්ථාවට ලබා ගැනීමට අපොහොසත් වී තිබුනු අතර අදාළ වගකිවයුතු නිළධාරීන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල කටයුතු කිරීමටද සංස්ථාව පියවර ගෙන නොතිබුණි.

(ඇ) බදු ගත් සිනමාශාලාවක 2007 හා 2008 වසර වෙනුවෙන් සිනමාශාලා හිමිකරුගෙන් අයවිය යුතු රු. 114,044 ක් වෙන්කර හදුනාගත හැකිවන පරිදි ගිණුම් පවත්වා නොතිබුණු අතර එම ප්‍රමාණය අය කර ගැනීමට පියවරගෙන නොතිබුණි.

(ඉ) නියමිත දිනට සංස්ථාවට ගෙවා නොමැති චිත්‍රපට කලී හා සංස්ථා භාරය වෙනුවෙන් අයකරනු ලබන අධිභාරය 2.5 % ක් ලාභාලාභ ගිණුමෙහි අධිභාර ආදායම් ලෙස රු. 3,065,482 ක් දක්වා ඇතත් 2011 වර්ෂය තුල කිසිදු අධිභාර ආදායමක් ලැබී නොතිබුණි.මෙම ආදායම ගිණුම් වල දැක්වීමෙන් වර්ෂයේ අලාභය රු. 3,065,482 කින් අඩුවෙන් පෙන්වා තිබුණ.

## 3.3 සෙමින් චලනය වන, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සදහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) චිත්‍රාගාරයේ වසර පහකට වඩා වැඩි කාලයක් චලනය නොවී / සෙමින් චලනය වන ශේෂයන් දැක්වූ අයිතම 523 ක් විය. එයන් අයිතම වර්ග 428 කට අදාල එකක ගණන 5060 ක් වූ අතර එම අයිතමයන්ගේ වටිනාකම දක්වා නොතිබුණි. අයිතම වර්ග 95 කට අදාල එකක ගණන 610 ක්වූ අතර එහි වටිනාකම රු. 112,310 ක් විය.

(ආ) වටිනාකම රු. 29,329,517 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 14 ක් වසර 16 සිට 27 කාල පරාසයක් තුළ නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

## 3.4 හදුනාගන්නා ලද පාඩු

චිත්‍රපට සංස්ථාව ආනයනය කළ චිත්‍රපටයක් වෙනුවෙන් දරන ලද පිරිවැය රු.8,597,915 ක් වූ අතර උපයා ඇති ආදායම රු. 4,631,721 ක් වූයෙන් රු.3,966,193 ක අලාභයක් ඇති බවට නිරීක්ෂණය විය.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

සංස්ථාව විසින් 2011 වර්ෂයේදී රු. 43,832,995 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 06 ක් ක්‍රියාත්මක කල අතර එම කොන්ත්‍රාත්තු වලින් 05 ක් සමාලෝචිත වර්ෂය තුලදී අවසන් කළ යුතු වූවත් එක් කොන්ත්‍රාත්තුවක් හැර අනෙක් කොන්ත්‍රාත්තු අවසන් කර නොතිබුණි. 2011 වර්ෂයේදී එම කොන්ත්‍රාත්තු වෙනුයෙන් දැරූ පිරිවැය රු. 12,074,002 ක් විය. අනෙක් කොන්ත්‍රාත්තුවෙහිද සමාලෝචිත වර්ෂයේ කළ යුතු කාර්යයන් ඉටු කර නොතිබුණි. එසේම එක් කොන්ත්‍රාත්තුවකින් ප්‍රමාද ගාස්තු අය කල බව දක්වා තිබුණද අය කර නොතිබුණි.

### 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්ය මණ්ඩලය තුල විධායක ශ්‍රේණියේ තනතුරු 17 ක් හා සහායක සේවාවල තනතුරු 15 ක පුරප්පාඩුව පැවති අතර , සුළු හා වෙනත් සේවාවල නිලධාරීන්ගේ අතිරික්තය පිළිවෙලින් 09 ක් හා 11 ක් විය.

(ආ) අනුමත නොවූ අංශ ප්‍රධානි තනතුරක් වෙනුවෙන් එම්ඒ 2 වැටුප් කණ්ඩයේ නිලධාරියෙකු වෙත චිත්‍රාගාරයේ සියළු කටයුතු පූර්ණ අධීක්ෂණය පවරා දී තිබුණි.

### 3.7 වාහන පරිභෝජනය

සංස්ථාව සතු වාහන ඇණිය 09 ක් වූ අතර එයින් 02 ක් වෙන්කල වාහන විය. 2011 වර්ෂය තුලදී එම වාහන ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 212,851 ක්වූ අතර නඩත්තු වියදම රු. 2,398,208 ක් හා ඉන්ධන වියදම රු. 2,070,606 ක් විය. ඒ අනුව කිලෝ මීටරයකට දරන ලද නඩත්තු හා ඉන්ධන වියදම පිළිවෙලින් රු. 11 ක් හා රු. 10 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීකෂණයන් කෙරේ.

(අ) 2011 වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්ම සංශෝධනය/ යාවත්කාලීන කර නොතිබුණි. 2007 - 2011 කාලපරිච්ජේදය සඳහා පිළියෙල කල සංයුක්ත සැලැස්ම 2011 වර්ෂයටද උපයෝගි කර තිබූ අතර එහි සදහන් පහත දැක්වෙන කාර්යයන් සමාලෝචිත වර්ෂය තුලදීද ඉටුකර නොතිබුණි.

(i) සංසථාව විසින් ඉන්දියානු හවුල් චිත්‍රපට දෙකක් , චීන හවුල් චිත්‍රපටයක් හා එක් ළමා චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම හා රූගත කිරීම් උපකරණ හා වැඩිදියුණු කල දර්ශන තල ලබා දීම.

(ii) සංස්ථාව තුල අංග සම්පූර්ණ මාධ්‍ය ඒකකයක් ඇති කිරීම .

(iii) සංස්ථාවේ පරිපාලන කටයුතු සංවර්ධනය හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා සියලු අංශ ආවරණය වන අයුරින් පරිගණක ජාල පද්ධතියක් හා තොරතුරු පද්ධතියක් ඇති කිරීම.

(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති චක්‍රලේඛයේ 5.1.2වගන්තියට අනුව ආයතනය සතුව පවත්නා සම්පත් ද , සංස්ථා කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි

විධිමත්ව සැකස කාර්ය මණ්ඩල සැලැස්මද , කාර්යසාධන දර්ශකද, පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඈ) ආවරණ කාලය තුළ අදාල ඉලක්ක සපුරා ගැනීම හා සැලසුම් ප්‍රගතිය කාලීනව සමාලෝචනය කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර 2001 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතීමෙන් ඵලදායී කළමණාකාරිත්ව පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් දායකත්වයක් නොසපයන බව නිරීක්ෂණය විය.

## 4.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් / වියදම්, තථ්‍ය ආදායම් / වියදම් සමග සැසදීමේදී ආදායම්/ වියදම් කාණ්ඩ 26 ක් සම්බන්ධයෙන් විචලනය 50% ක ට වඩා වැඩි වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයාට වරින්වර පෙන්වා දෙන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් කෙරෙහ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණයගැති /ණයහිමි පාලනය

(ආ) පුද්ගලික ලිපගොනු පවත්නා ගෙන යෑම

(ඇ) ආයෝජන

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) ආපසු ගෙවිය යුතු තැන්පතු

(ඊ) බැංකු සැසඳුම් පිළියෙල කිරීම

(උ) සංයුක්ත සැලැස්ම

(ඌ)) චිත්‍රාගාර ආදායම

(ඔ) ලෙජර් ගිණුම්